# ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ ව්‍යවස්ථාව

1. නම

පක්ෂයේ නම ප්‍රජාතාන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ වනු ඇත. දෙමළ භාෂාවෙන් එය ජනනායක ඉඩදුසාරි මුන්නනි වශයෙන්ද, ඉංග්‍රීසි භාෂාවෙන් ලෙෆ්ට් අන්ඩ් ඩිමොක්‍රැටික් ෆ්‍රන්ට් වශයෙන්ද හඳුන්වනු ලැබේ.

2. ප්‍රධාන කාර්යාලය - ලිපිනය

පක්ෂයේ ප්‍රධාන කාර්යාලය කොළඹ 10, විනයාලංකාර මාවත, අංක 49 දරණ ස්ථානයේ හෝ පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන ස්ථානයක වනු ඇත.

3. අරමුණ

3.1. පරිභෝජනය හා සම්පත් පිළිබඳ ගිජු බවින් විනිර්මුක්තව වූ බෙදා හදාගෙන ඔවුනොවුන් රැක බලාගෙන ජීවත් වන්නාවූ සංස්කෘතියක් විකසිත වන සමාජයක් ක්‍රමයෙන් ගොඩ නැංවීම.

3.2. එබඳු සමාජයක් තුළ පහත සඳහන් ගුණාංගයන් වර්ධනය කරගත යුතුය.

- මිනිසුන්ගේ ශ්‍රම ශක්තියෙන් නිපදවන දෙයින් ලැබෙන වටිනාකම තවත් මිනිසෙකු විසින් ප්‍රාග්ධනයේ බලයෙන් පැහැර ගැනීම මගින් ගොඩ ගැසෙන අයුතු ලාභයට ඉඩකඩක් නොමැති වූ ධනේශ්වර වාදයෙන් බැහැර වන සමාජවාදී සමාජයක් ගොඩනැගීම.

- සියලුම දෙනාගේ කාලීන ජීවන අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හැකිවීම.

- සියලුම දෙනාට සමාන අයිතීන් භුක්ති විඳීමට හැකිවීම.

- සෑම පුද්ගලයාටම සර්වාංගික වූ වර්ධනයක් ලැබීමට ඇති පහසුකම් හා අවස්ථා තිබීම.

- සමාජයේ පොදු කාර්යයන් ඉටු කරගැනීමට හා ප්‍රශ්න විසඳා ගැනීමට සියලු දෙනාටම සහභාගි වීමට හැකි වීම.
- මෙතෙක් නොවූ විරූ පුද්ගලික නිදහසක් පුරවැසියාට භුක්ති විඳීමේ හැකියාව
- සියළුම මිනිසුන් සතු නිර්මාණ ශක්තිය ප්‍රකාශ වීමට ඉඩ ප්‍රස්තා ලැබීම.

- පරිභෝජනවාදයෙන් හා ඉන්ද්‍රිය ආශාවන්ගෙන් ඔබ්බෙහි ඇති අධ්‍යාත්මික වින්දනය ලැබිය හැකි මාවත් විවර කිරීම.

- චිරස්ථායි සංවර්ධනයක් මගින් මිනිසා සහ පරිසරය අතර අන්‍යෝන්‍යතාවය සහතික කරීම.

3.3. ජාති, කුළ, ගෝත්‍ර, ආගම්, ආදිය මත භේද බින්න වීමකින් තොරව සියලුම මිනිසුන් හට තම තමන්ගේ අනන්‍යතාවය රැකගනිමින් සහජීවනයෙන් හා සහයෝගයෙන් හා සම්මිශ්‍රණයෙන් යුතුව ජීවත් විය හැකි පරිසරයක් ගොඩනැගීම. ඒ සඳහා සිංහල, දෙමළ, මුස්ලිම් ජන වර්ගයන් අතරද අනිකුත් ජන කොටස් අතරද සමානත්වය ඇති කරලීම. ඊට අමතරව සිංහල බහුතර ප්‍රදේශයන්හි සිංහල ජනතාව භුක්ති විඳින අයිතිය දෙමළ, මුස්ලිම් බහුතර ප්‍රදේශයන්හි ඔවුන්ටද ලැබිය හැකි වන පරිදි ස්වපාලන තත්ත්වයන් පිළිගැනීම.

3.4. රටේ සම්පත් උපරිම වශයෙන් සමාජයේත්, සියලු ජනතාවගේත් සුභ සිද්ධිය සඳහා යොදා ගැනීමට ඉඩ සැලසෙන පරිදි රටේ දේශපාලන ආර්ථිකය ගොඩනැගීම සහ එම ආර්ථිකයේ ඵල ප්‍රයෝජන සියලුම ජන කොටස් වලට සාධාරණ ලෙස බෙදී යන ක්‍රමයක් වැඩි දියුණු කිරීම.

3.5. යට කී අරමුණු ඉටු කර ගැනීම සඳහා සමාජවාදී සහ ප්‍රජාතන්ත්‍රවාදී අදහස් ඇත්තා වූ සියලු ප්‍රගතිශීලීන් එක්සත් කර

දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම හා ඒ උදෙසා සමාජ, දේශපාලන ක්‍රියාදාමයන් හි නිරත වීම.

3.6. ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා දේශපාලන අරගල, මැතිවරණ යනාදි ජනතා ක්‍රියාකාරිත්වය ගොඩනැගීම ඇතුලු අවශ්‍ය සියලුම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරිත්වයන් හි යෙදීම.

3.7. සමාජ සාධාරණත්වය ඉටු කර ගන්නා වූද, සියළු ජන කොටස් රැකබලා ගන්නා වූද, ජන කොටස්වල සංස්කෘතික ගුණාංගයන් ආරක්ෂා කර දෙන්නා වූ ඔවුනොවුන්ගේ නිදහස ආරක්ෂා කර දෙන්නා වූද සමාජ ක්‍රමයක් ගොඩනැගීම.

## 4. සාමාජිකත්වය

පක්ෂයේ අරමුණ හා පක්ෂයේ ව්‍යවස්ථාවන්ට එකඟ වන්නා වූ ඕනෑම පුද්ගලයෙකුට පක්ෂයට බැඳීම සඳහා පක්ෂය විසින් අනුමත කර ඇති සාමාජික ඉල්ලුම්පතක් සම්පූර්ණ කර දීමෙන් පසුව විධායක සභාවේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව සාමාජිකත්වය හිමිවේ.

## 5. සාමාජික මුදල්

සාමාජිකත්වය ලබා ගන්නා සියලු දෙනා වාර්ෂිකව හෝ මාසිකව පක්ෂයේ සාමාජික මුදල ගෙවිය යුතුය. මධ්‍යම කාරක සභාවේ තීරණයන්ට අනුකූලව සාමාජිකයින් විසින් ගෙවිය යුතු සාමාජික මුදල ඔවුන්ගේ අදායමට අනුකූල විය යුතුය ඒ අනුව මාසික ගෙවිය යුතු සාමාජික මුදල නියම කිරීම විධායක සභාව සතුය. එහෙත් අවම වාරෂික සාමාජික මුදල ආදායම නොමැති අයෙකු වූවත් වසරකට රුපියල් 240/-ක් විය යුතුය. (මසකට රු.20/- බැගිනි) එම මුදල සාමාජිකයාගෙන් අයකර ගැනීම පිළිබඳව කුමන හෝ තීරණයකට එලබීමට විධායක සභාවේ අනුමැතිය දිය හැකිය. ගෙවන ලද සාමාජික මුදලට එවෙලේම රිසිට් පතක් නිකුත් කළ යුතු.

## 6. මහා සම්මේලනය

6.1. පක්ෂයේ ප්‍රධාන මණ්ඩලය මහා සම්මේලනය වනු ඇත. එම සම්මේලනය අවම වශයෙන් අවුරුදු දෙකකට වරක් පැවැත්විය යුතුය. මුලු සාමාජිකත්වයෙන් 1/3 කගේ ඉල්ලීමක් ඇති විට විශේෂ සම්මේලනයක් කැඳවිය යුතුය.

6.2. පක්ෂයේ මහා සම්මේලනය සක්‍රීය සමාජිකයන්ගේ නියෝජිත

සම්මේලනයක් විය යුතුය. සක්‍රීය භාවය මධ්‍යම කාරක සභාවේ නිර්නායකයන් මත සිදුවිය යුතුය. සම්මේලනයේ ඝන පූර්ණය එම සාමාජිකත්වයේ 1/3ක් විය යුතුය.

6.3. පක්ෂ සම්මේලනය කැඳවීමේ වගකීම සිටින මධ්‍යම කාරක සභාව සතුවේ.

6.4. පක්ෂ සම්මේලනය ආරම්භයේදීම සම්මේලනය මෙහෙයවීම සඳහා සභාපති මණ්ඩලයක් හා සියළුම සාකච්ඡා වාර්තා ගත කිරීම, තීන්දු සටහන් කිරීම සඳහා ලේකම් මණ්ඩලයක් සමුළුව රැස්වූ වහාම නම් කර සමුළුවේ අනුමැතිය ලබා ගත යුතුය. පක්ෂ සම්මේලනයට පැමිණෙන සියළු සාමාජිකයින්ගේ පොදු පහසුකම් සලසාදීම සම්මේලනය කැඳවන මධ්‍යම කාරක සභාව හා විධායක සභාව සතු වගකීමක් වේ.

6.5. සම්මේලනයට සහභාගීවීමට සුදුසුකම් ලබන්නා වූ සියළු සාමාජිකයන් සම්මේලනය පැවැත්වීමට පෙර දිනය දක්වා සාමාජික මුදල් ගෙවා තම සාමාජිකත්වය තහවුරු කර ගත යුතුය. මේ පිළිබඳව අවසාන තීරණය මධ්‍යම කාරක සභාව සතුය.

## 7. මධ්‍යම කාරක සභාව

මධ්‍යම කාරක සභාව තුන් මසකට වරක් අවම වශයෙන් රැස්විය යුතුය. එසේ නොකැඳවූවහොත් මධ්‍යම කාරක සභාවේ සමාජිකයින් 1/3 කගේ ඉල්ලීම මත රැස්වීම කැඳවිය හැක.

7.1. සම්මේලනයේ රහස් ඡන්දයකින් මධ්‍යම කාරක සභාව පත් කරගත යුතුය. ඒ සඳහා ඡන්ද බලය ඇත්තේ කැඳවනු ලැබූ සක්‍රීය සාමාජිකයින්ට පමණි.

7.2. සම්මේලනයෙන් පත්කර ගන්නා මධ්‍යම කාරක සභාවේ සභිකයන් අනුපාතිකව සම්මේලනය තීන්දු කරන සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය. දිස්ත්‍රික් ලේකම්වරු මධ්‍යම කාරක සභිකයින් ලෙස නිලබලයෙන්ම මධ්‍යම කාරක සභාවට පත්වේ. එහෙත් ඔවුන්ට ඡන්ද බලයක් නැත.

7.3. මධ්‍යම කාරක සභාවට නිලබලයෙන් පත්වෙන දිස්ත්‍රික්

ලේකම්වරුන් පිළිබඳ වැඩිදුර තීරණ ගැනීම සඳහා මධ්‍යම කාරක සභාවට බලය ඇත.

7.4. මධ්‍යම කාරක සභාවේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවලදී පක්ෂ සම්මේලනයේදී මධ්‍යම කාරක සභාවට තරඟ කිරීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමෙන් පසුව තේරී පත් වූ ලේඛනයේ නියමිත ගණන පත්වූවායින් පසුව ලේඛනයේ ඉතිරිව සිටින අගෙන් පිළිවෙලින් මධ්‍යම කාරක සභාවේ පුරප්පාඩු සඳහා පත් කර ගත යුතුය. එසේ පත් කර ගැනීමට පොරොත්තු ලේඛනයේ නම් සඳහන් නොවන අවස්ථාවලදී මධ්‍යම කාරක සභාවේ වැඩි ඡන්දයෙන් සහෝදරයකු සහෝදරියක පත් කර ගත හැකිය.

7.5. පක්ෂයේ සම්මේලනය පවත්වා අවසන් වූ විගසම, පත් වූ මධ්‍යම කාරක සභාව රැස්වී ලේකම් වරයා පත් කර ගත යුතුය. පක්ෂයේ ලේකම් සහෝදරයා දේශපාලන අධිකාරි බලය ඇති අයෙක් ලෙස න්‍යායික දේශපාලන තලයේ මඟ පෙන්වන්නා වේ. ඔහු මධ්‍යම කාර සභාවේ උපදෙස් හා අනුමැතිය මත දේශපාලන තීන්දු ගැනීමට පියවර ගත යුතුය. ඉන් පසුව එළඹෙන මධ්‍යම කාරක සභාවකදී සෙසු තිලවලට හා මණ්ඩලවලට පුද්ගලයින් මධ්‍යම කාරක සභාව විසින් පත් කළ යුතුය.

8. පක්ෂයේ සංවිධාන ව්‍යුහය

1. සභාපති 1 උප සභාපති 1
2. ලේකම් 1 නියෝජ්‍ය ලේකම් 1 උපලේකම් 1
3. සංවිධායක ලේකම් (ජාතික සංවිධායක) 1 සංවිනධායක උප ලේකම් 1
4. වෘත්තීය මණ්ඩලය ලේකම් 1 උප ලේකම් 1
5. අධ්‍යාපන මණ්ඩලය ලේකම් 1 උප ලේකම් 1
6. මුදල් මණ්ඩලය ලේකම් 1 උප ලේකම් 1
7. ජාතික ඒකාබද්ධතා මණ්ඩලය ලේකම් 1 උප ලේකම් 1
8. ජන මාධ්‍ය ලේකම් 1
9. බහුජන මණ්ඩලය ලේකම් 1 උප ලේකම් 1 සංස්කෘතික ලේකම් 1

10. තරුණ සමිති මණ්ඩලය - තරුණ ලේකම් 1 කාන්තා ලේකම් 1 ශිෂ්‍ය ලේකම් 1

තරුණ උප ලේකම් 1 කාන්තා උප ලේකම් 1 ශිෂ්‍ය උප ලේකම් 1

(ජාත්‍යන්තර ලේකම් තනතුර 2011 - 11 - 05 දින මධ්‍යම කාරක සභාවේදී අනුමත කරන ලදී)

## 9. විධායක සභාව

සම්මේලනයකින් පසුව පවත්වන දෙවන මධ්‍යම කාරක සභාවේ සිටින අයගෙන් දේශපාලන පරිනතභාවයකින් යුත් රටේ සිදුවන වෙනස්වීම් පිළිබඳව ප්‍රයෝගික දැනුමක් හා අවබෝධයක් ඇති සහෝදරවරුන් මධ්‍යම කාරක සභාව විසින් විධායක සභාවට පත් කර ගත යුතුය. එසේ පත් කර ගැනීමේදී සභාපති, ලේකම්, සංවිධායක ලේකම්, වෘත්තීය ලේකම්, මුදල් ලේකම්, අධ්‍යාපන ලේකම්, ජාතික එකාබද්ධතා ලේකම්, තරුණ ලේකම්, බහුජන ලේකම්, සංස්කෘතික ලේකම්, ජනමාධ්‍ය ලේකම්, කාන්තා ලේකම් ආදිය නියෝජනය වන පරිදි විධායක සභාව සඳහා 12 දෙනෙක් හා අමතරව තවත් 3 දෙනෙක්ද ඇතුළුව 15 දෙනෙකුගෙන් කර ගත යුතුවේ. එහි කම්කරු පංතිය නියෝජනය සියයට 60ක් විය යුතුය. ඒ පිළිබඳව තීරණය කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතුය.

9.1. ලේකම්වරුන්, මණ්ඩල ප්‍රධානීන්, බහුජන නායකයින් ගෙන් විධායක සභාව සමන්විත වේ. විධායක සභාවේ ලේකම් වන්නේද පක්ෂයේ ලේකම් සහෝදරයා වේ. මධ්‍යම කාරක සභාව ගනු ලැබූ තීරණයන් ක්‍රියාත්මක වීම ගැන මධ්‍යම කාරක සභාව සොයා බැලිය යුතුය. පක්ෂයට සම්බන්ධ සියළුම අංශවලට මැදිහත්වීමට සංවිධායක ලේකම්ට බලය පැවරේ.

## 10. භාරකාරත්වය

පක්ෂයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, සංවිධායක ලේකම් හා වෘත්තීය ලේකම් පක්ෂයේ භාරකරුවන් වනු ඇත. පක්ෂයේ සියලුම දේපල වලට ඔවුන් වගකිව යුතු වන්නේය. මෙම භාරකරුවන් මධ්‍යම කාරක සභාව හා පක්ෂ සම්මේලනයට වගකීමෙන් බැඳී සිටී.

11. ලේකම්

පක්ෂයේ සාමාජික ලේඛනය ඇතුළු සියලුම ලේඛන නිසි පරිදි තබා ගැනීම සහ පක්ෂය තුළ වැඩකටයුතු නිසි ලෙස ඉටු කිරීමේ වගකීම ලේකම් වෙත පැවරේ. පක්ෂයේ සියලුම මණ්ඩල කැඳවීම සඳහා අවශ්‍ය කටයුතු යෙදීම සහ පක්ෂයේ සම්මේලනයට අවශ්‍ය ලියකියවිලි සූදානම් කිරීමේ වගකීම ලේකම් සතුවේ. ඔහු න්‍යායික වශයෙන් හා දේශපාලන වශයෙන් පරිනත මඟ පෙන්වන්නෙකු විය යුතුය.

12. භාණ්ඩාගාරික

පක්ෂයේ සියලුම මුදල් පිළිබඳ කටයුතු භාණ්ඩාගාරික වෙත පැරේ. සාමාජික මුදල් නිසි පරිදි එකතු කිරීම, පක්ෂයට අවශ්‍ය වෙතත් අරමුදල් ඇති කිරීම සහ ඒවා පාලනය කිරීමද භාණ්ඩාගාරිකගේ වගකීම වනු ඇත. භාණ්ඩාගාරික ක්‍රියා කරනුයේ මුදල් මණ්ඩලයේ ලේකම් ලෙසය. මාසික ගිණුම් මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේය. පක්ෂයේ ගිණුම්, හා අරමුදල් භාණ්ඩාගාරික හා විධායක සභාවේ තවත් දෙදෙනෙකුගේ භාරයේ තිබිය යුතුය.

12.1. මුදල් පරිහරණය කිරීම විධායක සභාවේ තීරණය පරිදි භාණ්ඩාගාරික විසින් කරනු ඇත. පක්ෂයේ සියලුම මුදල් සභාපති, ලේකම්, සහ භාණ්ඩාගරිකගේ නමින් බැංකු ගිණුමක තැන්පත් කළ යුතුය. බැංකු ගිණුම් වලින් මුදල් ගැනීම භාණ්ඩාගාරිකගේ හා තවත් අයෙකුගේ අත්සන් සහිතව කල යුතුය. මෙම නියමයන් විධායක සභාවට විටින් විට වෙනස් කල හැක.

13. විනය

විනය කටයුතු තනිකරම විනය මණ්ඩලයට භාරවේ. මෙම මණ්ඩලය වගකියනුයේ සම්මේලනයටය. පක්ෂයේ සියලුම සාමාජිකයින් පක්ෂයේ විනය සෑම අයුරකින්ම ආරක්ෂා කර ගත යුතුවේ. පක්ෂයේ ප්‍රතිපත්තිවලට හා ක්‍රියාමාර්ගට එකඟව කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. තම ක්‍රියා කලාපයෙන් පක්ෂය අගෞරවයට පත් කිරීම පක්ෂයේ විනය උල්ලංඝනය කිරීමක් වශයෙන් සලකනු ලැබේ. කෙසේ වෙතත් සාධාරණ විභාගයකින් තොරව කිසිම සාමාජිකයකුගේ අයිතිවාසිකම් අහිමි කිරීමට පක්ෂ ව්‍යවස්ථාවෙන් කිසියම්ම අවකාශයක් නොලැබෙනු ඇත. විනය මණ්ඩලය පක්ෂ සම්මේලනයෙන් පත්විය යුතුය. විනය

තීරණ ක්‍රියාත්මක කිරීම මධ්‍යම කාරක සභාව සතු වේ.

14. පක්ෂයේ ධජය

පක්ෂයේ ධජය රතුවන් පසුබිමක කසා වර්ණයෙන් යුත් සූරිය මල තුල දැතිරෝදය හා වී කරලින් වට වූ චක්‍රයක් මත දෑකැත්තක් හා මිටියකින් සමන්විත වනු ඇත.

15. පක්ෂයේ ගීතය

වැඩ කරන ජනතාවගේ ජාත්‍යන්තර ගීතය අනුසාරයෙන් නිර්මාණය විය යුතුය. දැනට පිලිගෙන ඇති ගීතය පක්ෂයේ ගීතය ලෙස අනුමත වේ.

16. ව්‍යවස්ථා සංශෝධන

ව්‍යවස්ථා සංශෝධන සම්මේලනයකදී සම්මත විය යුතු අතර මධ්‍යම කාරක සභාවටද සම්මේලනයෙ ආවරණ අනුමැතියට යටත්ව හදිසි අවශ්‍යතා මත යම් සංශෝධන සම්මත කරගත හැකිය.

17. සම්ප්‍රදාය

සිංහල, දෙමළ, මුස්ලිම් ආදී සෑම ජනවර්ගයකමද කම්කරු, ගොවි, ධීවර, ආදී සෑම ජන කොටසක්මද ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයමද තරුණ තරුණියන්ද හැකි තාක් දුරට නියෝජනය වන අයුරින් පක්ෂයේ විවිධ මණ්ඩල පත් කර ගැනීමේ සම්ප්‍රදායන් විකාශනය කර ගත යුතුය.

(2011 දෙසැම්බර් 19/20 දින පැවති 4 වන පක්ෂ සම්මේලනයේදී මෙම ව්‍යවස්ථාව ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.)